1839

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 06 | |
| විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I,II | |
| කාලය / காலம் / Time | පැය 02 | |

නම :- .................................................... විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:

* පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* දෙවන කොටසට අදාළ පිළිතුරු ලියා පළමුකොටසට අමුණා බාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ඇති වගන්ති නිවැරදිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(01) විදුහල්පතිතුමා පාසලේ අධ්‍යාපන කටයුතුවල නියමුවා ලෙස ක්‍රියා කරයි. ( )

(02) සක්‍රිය සවන්දීම යනු අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව අසා සිටීමයි. ( )

(03) පාසලක සංවර්ධන කටයුතුවලදී ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වය පාසලට බාධාවකි. ( )

(04) අප ප්‍රයෝජනයට ගන්නා බොහෝ සම්පත් සීමිතය. ( )

(05) වීදි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම මහනගර සභාවක කාර්යයක් නොවේ. ( )

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(06) යම් කාර්යයක් වඩා ඵලදායිව කිරීම සඳහා කාර්ය කොටස් අනුපිළිවෙලකට කාල රාමුවකට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීම.

(1) කළමනාකරණයයි (2) සැලසුම්කරණයයි
(3) පාලනයයි (4) සංවිධානයයි

(07) අප රටේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය වනුයේ,

(1) ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි (2) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි
(3) පළාතයි (4) දිස්ත්‍රික්කයයි

(08) පරිසරයේ ඇති සම්පත් සංරක්ෂණය කළයුතු වන්නේ,

(1) මිනිසාට සම්පත් ප්‍රයෝජනවත් නිසාය.
(2) සම්පත් වලින් විවිධ කාර්යයන් කළ හැකි නිසාය.
(3) සම්පත් අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම යුතුකමක් වන නිසාය.
(4) රටේ සංවර්ධනය වේගවත් කිරීම අවශ්‍ය නිසාය.

(09) A - හිරුඑළිය B - යාන වාහන C- උපකරණ D - පිරිසිදු ජලය

ඉහත සම්පත් අතරින් ස්වභාවික සම්පත් දෙකක් පමණක් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) B හා C (2) A හා D (3) C හා D (4) A හා C



185

(10) ශ්‍රී ලංකාවේ ඇති දිස්ත්‍රික්ක ගණන හා පළාත් ගණන නිවැරදිව පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) 26 හා 9 කි. (2) 28 හා 9 කි. (3) 9 හා 25 කි. (4) 25 හා 9 කි.

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(අනන්‍යතාව, ආගමික, රාජ්‍ය ඔසුසල, එළදායි, යහපත්, සම්පත්)

(11) මහාචාර්ය සේනක බිබිලේ මහතා..........................................................බිහිකිරීමට පුරෝගාමී විය.

(12) පාසල් කොඩිය පාසලේ.......................................................... පිළිබිඹු කරන තවත් සංකේතයකි.

(13) ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ග හා..........................................................ජන කොටස් වාසය කරයි.

(14) ජංගම දුරකථනය අපට..........................................බහු කාර්යය උපකරණයක් ලෙස යොදා ගත හැකිය.

(15) ස්වභාව ධර්මයෙන් අපට ලැබී ඇති දායාද .......................................... ලෙස හැඳින්විය හැකිය.

- අංක 16 සිට 20 දක්වා ඇති 'අ' සහ 'ආ' කොටස් නිවැරදි ගළපා යා කරන්න.

| 'අ' | | 'ආ' |
|---|---|---|
| (16) දිස්ත්‍රික්කය | A | වෛද්‍යවරුන් |
| (17) පාසල් සංස්කෘතිය | B | සහනාධාර ලබාදීම |
| (18) මානව සම්පත | C | මාර්ග ආරක්ෂාව |
| (19) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | D | දිස්ත්‍රික් ලේකම් |
| (20) මාර්ග සංඥා පුවරු | E | නිල ඇඳුම |
| | F | ග්‍රාමනිලධාරී |

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (i) පාසල් ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක ලෙස ඔබගේ ඇතුළත්වීමේ අංකය නිවැරදිව දැනගත හැකි ලේඛන දෙකක් සඳහන් කරන්න.

(ii) පාසල් ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක ලෙස ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.

(iii) පාසලක සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් කමිටු දෙකක් ලියන්න.

(iv) ඔබ සතු යහපත් ගතිගුණ දෙකක් නම් කරන්න.

(v) භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න.

(vi) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

(vii) භෞතික සම්පත් බෙදිය හැකි කොටස් දෙක ලියන්න.

(viii) ආචාරශීලී ලෙස භාෂා භාවිතයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2 x 8 = 16)

(02) (i) ළමයින් සම්බන්ධයෙන් පාසලක පවතින පොදු නීතිරීති දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පාසලෙන් සමාජයට සැපයෙන සේවාවන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පාසල් සිසුවකු සිසුවියක ලෙස ඔබගේ ජීවිතය සාර්ථකත්වය උදෙසා ඇති කරගෙන ඇති අරමුණු තුනක් ලියා, ඒවා ජයගැනීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 05)


(03) පාසල් සිසුවෙකු ලෙස මනා විනයකින් හා ශික්ෂණයකින් යුතුව කටයුතු කිරීම තමාට මෙන් ම මුළු සමාජයටම යහපතකි.

(i) විනය හා ශික්ෂණය යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)

(ii) විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පාසල තුළදී මනා විනය හා ශික්ෂණය සඳහා පවත්වාගත යුතු ජීවන පුරුදු පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

(04)




(i) ඉහත රූප සටහනේ A හා B ලෙස දක්වා ඇති පරිපාලන ඒකකය පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) මානව සම්පත විධිමත් ව පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ ප්‍රදේශයේ ඇති විවිධ ආගමික ස්ථාන මගින් සිදුවන සේවාවන් පහක් ලියන්න. (ලකුණු 05)

(05) (i) ඔබ ප්‍රදේශයේ ඇති සමිති සමාගම් මගින් සිදුවන සේවාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අපට සේවා සපයන ආයතනවල යුතුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පොදු දේපල සුරැකීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ලකුණු 05)

(06) (i) ජලයෙන් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) නිවසේදී විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කළ හැකි ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) යහපත් පුරවැසියෙකු වශයෙන් පරිසරය සුරැකීම සඳහා දායක විය හැකි ආකාර පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (i) අපේ රටේ දේශීය නිෂ්පාදන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දේශීය නිෂ්පාදන හා දේශීය සම්පත් අගය කිරීමේ වැදගත්කම පිළිබඳ වාක්‍යය හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලාංකිකයෙකු වීම නිසා ඔබට ඇතිවන හැඟීම් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)